සන්නස SANNASA




# ඇයි තරහෙන්?

"හෙලෝ. වාට්ටුවෙන් කතා කරන්නේ. අනේ ඩොක්ටර් ඉක්මනට එන්න. මේ දැන් කැෂුවල්ටි එකක් ආවා"
වෛද්‍ය නිල නිවාසයේ රාත්‍රී ආහාරය ගනිමින් සිටි වෛද්‍යවරයාට දුර කතන ඇමතුමක් ආවේ වාට්ටු බාර හෙද නිලධාරිනියගෙනි.

"පඩිපෙලකින් වැටිලා. ඉන්ටර්නල් බ්ලීඩින් වගේ"

වහාම අවශ්‍ය හදිසි ප්‍රතිකාර දුරකතනයෙන් ම නියම කළ වෛද්‍යවරයා ආහාර ගැනීම නවතා විනාඩි කීපයක් ඇතුළත වාට්ටුවට දිව්වේ ය.

පිටතින් තුවාල කිසිවක් නොපෙණුන ද, තිස් හැවිරිදි තරුණයා සුදු මැලි වී, අඩ සිහියෙන් සිටියේ සිරුරේ අභ්‍යන්තරයට රුධිරය ගැලීමක් සිදුව තිබුණ බැවිනි. රුධිරය ලබා දී වහාම කළ ශල්‍යකර්මයේ දී දැක ගත හැකි වූයේ පුපුරා ගිය ප්ලීහාවයි. උසකින් වැටීම, රිය අනතුරු , එකිනෙකා අතර සිදුවන පහර දීම් වල දී ආදී අද සමාජයේ බහුලව දකින්නට ලැබෙන අනතුරු වල දී මෙවන් අවස්ථා ඇති විය හැකි ය. වහාම සිදු කළ ප්ලීහාව ඉවත්කිරීමේ ශල්‍ය කර්මය නිසා ඔහුගේ ජීවිතය බේරා ගැනීමට හැකි විය. මහා ප්‍රාචීරයට යටින්, ආමාශයට පිටු පසින් සැඟවී මෙන් තිබෙන වැඩි කතා බහකට ලක් නොවන අවයවයක් ඇත. එය නමින් ප්ලීහාව (**spleen**) නම් වේ. අතීතයේ ප්ලීහාව ගැන මිනිසුන් සිතුවේ අපට කෝපය ඇති කරන අවයවය එය බව ය. ඒ නිසා නිතර කෝප ගන්නා අය .ස්ප්ලීන්. නමින් හැඳින් වූ අතර ඒ නිසා එය සිරුරට අනවශ්‍ය එකක් බවට අදහසක් තිබිණි.

එය මෘදු ,ස්පොන්ජ් එකක් මෙන් ලේ නහර විශාල ප්‍රමාණයකින් සෑදි, දම්පැහැයට හුරු පාටකින් යුතු අවයවයකි. වැඩිහිටියෙකුගේ ප්ලීහාව අඟල් පහක් පමණ දිගය. අඟල් තුනක් පමණ පළල ය. එය පුංචි වුවත් කාර්ය බහුල අවයවයකි. අපේ රුධිරයේ ඇති රතු රුධිරාණුවක ආයු කාලය කෙටිය. එය දින 120කි. එම වයස්ගත සෛල ප්ලීහාව හරහා ගමන් කරද්දී ඒවා කැඩී බිඳී යන අතර යහපත් රුධිර සෛල වලට පමණක් එය පසු කර යා හැකි ය. විනාශ වූ රතු සෛල භක්ෂ සෛල විසින් ගිල දමනු ලබයි. එනම් ප්ලීහාව රුධිර පෙරහනයක් සේ ක්‍රියා කරයි. අරපිරිමැස්ම ගැන ලොකුම පාඩම අපට කියා දෙන්නේ සිරුරේ ක්‍රියාකාරීත්වයයි. රතුරුධිරාණුව කැඩී බිඳී එහි සංඝටක වෙන් වූ පසු ඒ කිසිවක් අපතේ යැවීමට සිරුර ලෑස්ති නැත. එහි ඇති ප්‍රෝටීන් කොටස් අක්මාවට ද හිමොග්ලොබින් වල ඇති යකඩ නැවත රුධිරාණු නිපදවීමට ඇට මිදුලු වලටද යවනු ලැබේ.

මීට අමතරව ප්ලීහාව රුධිර ගබඩාවක් ලෙසද ක්‍රියා කරයි. සිරුරේ වෙනත් ස්ථානයක අනතුරකින් රුධිරය වැගිරීමක් වුවහොත් ඒ අඩුපාඩුව තරමක් හෝ සමනය කර ගැනීමට ප්ලීහාවෙන් රුධිරය ලබා ගත හැකිය. ප්ලීහාවේ තවත් ප්‍රධාන කටයුත්තක් වන්නේ එයට විවිධ බැක්ටීරියා, වෛරස් කොටු කර ගෙන විනාශ කිරීමේ හැකියාවයි. විෂබීජ ශරීර ගත වූ විට ඒවාට විරුද්ධව ප්‍රතිදේහ නිෂ්පාදනය වන්නේ වසා සෛල වල දිය. එම වසා සෛල නිස්පාදනයේ දී ප්ලීහාව ද විශාල කාර්යභාරයක් ඉටු කරයි.

සිරුරේ ඇති පද්ධති මොනවාදැයි කිසිවෙකුට පැහැදිලි කිරීමට අවශ්‍ය වූ විට කොළයක් ගෙන රූප සටහනක් ඇඳ එය පෙන්වීමට හැකි ය. එහෙත් එක්තරා වැදගත්ම පද්ධතියක් අපේ අතට හසු වන ව්‍යුහාත්මක ගොනු වීමක් නොමැතිව සිරුර පුරා විහිදී පවතී. ඒ පද්ධතිය "ප්‍රතිශක්ති පද්ධතිය" යි. හැඳින්වේ. එම පද්ධතිය ,ජාලක අන්තශ්වද පද්ධතිය, (**reticuloendothelial system**) යනුවෙන් ද හඳුන්වනු ලැබේ. එම පද්ධතියට අයත් සෛල රුධිරයේත්, සම්බන්ධක පටක වලත්, ප්ලීහාවේත්, අක්මාවේත්, පෙනහලු තුළත්, ඇට මිදුළු වලත්, වසා ගැටිති වලත්, අපට හමු වේ. ඒවායින් කෙරෙන කාරිය කුමක්ද? රුධිර සෛල වර්ධනය සහ විනාශ කිරීම, මේද ගබඩා කිරීම, යකඩ හා වර්ණක වල පරිවෘත්තීය ක්‍රියාව, ආදී බොහෝ කටයුතු වල පෙරමුණ ගන්නේ මේ සෛලවේ. රුධිරය තුළ සැරි සරමින් කසළ ශෝධක කාර්යය ඉටුකරන භක්ෂ සෛලද අයත් වන්නේ මෙම පද්ධතියටයි.

පෙරහනයකින් හොඳ දේ පෙරී ගිය පසු ඉතිරි වන්නේ අයහපත් දේ බව අපි දනිමු. අපට උදව් කරන්නට ගොස් ප්ලීහාවට නිරතුරුවම විෂබීජ වලට මුහුණ දීමට සිදු වන බැවින් විවිධ ආසාදන වල දී, හා තැලසීමියා, මැලේරියා ආදී රතු සෛල විශාල වශයෙන් විනාශ වන රෝග වල දී ප්ලීහාව ඉදිම්ම සුලබව දක්නට ලැබේ. වෛද්‍යවරයකු ඔබව පරීක්ෂා කිරීමේ



දී, වම් ඇලයට හරවා, එක් අතක් උරස් කුහරයේ පහත කොටසින් තබා සෙමින් තද කරමින් අනිත් අතින් ඉලඇට කූඩුව මායිමෙන් උදරයේ ඉහළ කොටස ඔබා බලන්නේ ප්ලීහාවේ ප්‍රමාණයයි. එය රෝගී වූ විට පිටතින් අතට දැනෙන ලෙස විශාල වශයෙන් ඉදිමෙන බැවිනි. හොජ්කින්ස් ලිම්පෝමා වැනි වසා සෛල ආශ්‍රිත පිළිකා රෝග වල දීද, ලියුකේමියා වැනි රුධිර සෛල ආශ්‍රිත රෝග වල දීද ප්ලීහාව ඉදිමීම සුලබව දක්නට ලැබේ.

ප්ලීහාව ඉදිමීම වෛද්‍ය පරීක්ෂණයකදී දැන ගන්නා තුරු බොහෝ අයට රෝග ලක්ෂණ ඇති නොකරයි. එහෙත් යම් කෙනෙකුගේ ප්ලීහාව ඉදිමී ඇති බව දැන ගතහොත් අදාළ රුධිර පරීක්ෂණ සහ ස්කෑන් පරීක්ෂණ කර ඊට හේතුව වහාම සෙවිය යුතු ය. ප්ලීහාව ඉදිමී ඇති සමහර අවස්ථා වල දී රක්තහීනතාවය හෝ පිළිකා නිසා මහන්සිගතියත්, අක්මා රෝග නිසා රුධිරය කැටි නොගැසෙන අවස්ථාත්, වෙනත් ආසාදන තත්ව වල රෝග ලක්ෂණත් පෙන්නුම් කළ හැකිය. ඉදිමුන ප්ලීහාව සුලු අනතුරකදී වුව පහසුවෙන්ම පැලීමකට ලක් වීමට ඉඩ තිබේ.

ප්ලීහාවට සිදු වන අනතුරු වල දී අධික රුධිර වහනය නැවැත්වීමට ප්ලීහාව ඉවත් කිරීමට සිදු වේ. එම අවයවය නැතිව ජීවත් වීමට හැකි වුවද ආසාදන තත්ව පිළිබඳව නිරන්තර අවධානයෙන් යුතුව ප්‍රතිකාර ගැනීමට සිදු වේ. අපට විශාල සේවයක් කරන ප්ලීහාවට කෝපය ඇති කරන අවයවයක් ලෙස චෝදනා කිරීම අසාධාරණ නොවේද?

**වෛද්‍ය ලංකා සිරිවර්ධන**






## චීනී හෙට්ටිගොඩ

